# කපටි නරියා



සහේලි පෙරේරා

# කපටි නරියා


**සහේලි පෙරේරා**

කතෘ


**පළමු දිගහැරිම**


**මහාමායා බාලිකා විද්‍යාලය**

**2 ශ්‍රේණිය E**



**2025/02/08**

**ISBN 978-624-208-224-0**

පිදුම

අරෝෂා පින්නදූව ගුරුතුමියට

ආදරයෙන්

# පෙරවදන

සාහිත්‍ය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි.ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපී පෙනෙන්නේද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි. දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනිමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂී සිදුවිමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරදන අත්ථදස්සී මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රධාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමු කරන "හෙරණගත්කරණී" ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රිය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයෙන් ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහනයක් ද වෙයි. ජිවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාවය හඳුනා ගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,
ශශිකලා සේනාධීර,
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර

වනාන්තරයක් තුළ එක්තරා ගල් ගුහාවක නරියෙක් ජීවත්

වුණා.

ඒ නරියාට නරක පුරුද්දක් තිබුණා.

එයා අනිත් අයව රවට්ටලා හැම දේම උදුර ගන්නවා.



දවසක් මේ නරියා කැළෑව ළඟ තිබුණ එක ගම ගෙදරකට ගියා.

ඌ කිකිළියෙකුගේ බිත්තරයක් සොරකම්කර ගන්න හැදුවා.

“ආ කෝ මගේ බිත්තරේ”

කිකිළි බිත්තරය සොයමින් කිවුවා.

එතකොටම කිකිළි දැක්කා නරියා බිත්තරය සොරකම් කරනවා.



කිකිළිට හොඳටම දුක හිතුණා,

එයා නරියාට කිවුවා,

“අනේ නරි රාළ, මගේ බිත්තරය ගන්න එපා, ඒක ඇතුළේ මගේ පැටියා ඉන්නවා.”

ඒත් නරියා කිකිළි අම්මා කියන දේ ඇහුවේ නැහැ.

ඌ කටින් බිත්තරය අරගෙන කැළෑවට දුවලා ගියා.

කිකිළි අම්මා හොඳටම ඇඬුවා.

එයාගේ මේ දුක දෙවියන්ටත් ඇසුණා.

දෙවියෝ හොඳ වැඩක් කරන්නම් කියලා හෙට දවස උදා වෙනකම් ඉවසගෙන හිටියා.

ඔන්න...ඒ දවස උදා වුණා.

දෙවියෝ නරියාට අණ කළා එයාට එන්න කියලා.

එදා නම් නරියා බය වුණා.

එයා බයෙන් බයේ එතනට ආවා.



දෙවියෝ නරියාට පුංචි පැටියෙක්ව පෙන්නලා කියුවා,

“නරි රාළ, අද මම මගේ දවල් කෑමට ගන්න හදන කෑම හෝජනය තමා මේ, රසයි ද බලන්න උඹත් එනවද මාත් එක්ක කෑමට කියලා”.

දෙවියන් ළඟ හිටිය පැටියා දිහා නරියා බැලුවා,

නරි රාළගේ ඇස් දෙක උඩ ගියා.

“අනේ දෙවියනේ මගේ දරු පැටියා නේද මේ…”

නරි රාළ බයේ කෑගැසුවා.

“අනේ මගේ දරුවා බේරන්න.”

“ඒ වෙනුවට මාව අරගන්න”

නරියා අඩමින් කියුවා.



දෙවියන් එතකොට කිවුවා,
“නරි රාළ, උඹ අනිත් අයගේ දේවල් සොරකම් කරලා ඒ අයට දුක් දෙන එක නවත්වන්න ඕන..”

නරියා මෙහෙම කිවුවා,

“අනේ දෙවියනේ, මම ආයේ කවදාවත් එහෙම කරන්නේ නැහැ..මට ඕන දඬුවමක් දෙන්න”.

හොඳයි…උඹ මට පොරොන්දු වෙන්න ඕන කාටවත් කරදර කරන්නේ නැහැ කියලා.



ඊට පස්සේ නරියා ආපසු කිකිළිට බිත්තරය ගිහින් දුන්නා.

දෙවියන් නරියා කියපු දේ කරපු නිසා එයාගේ පැටියා ආපහු දුන්නා.

එදා ඉන් පස්සේ නම් නරියාට තේරුණා අනිත් අයට කරදර කරන්න හොඳ නැහැ කියලා.

එදා ඉඳන් නරියා හොඳ කෙනෙක් වුණා.



# පසුවදන



රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍ය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මාණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැඟිම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරිමට ලැබිම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාවය වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යයන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසය එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනිම විශේෂත්වයකි. මෙහිදි මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පතිතුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරිමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමකි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබිමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්විමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරි මෙන්ම සමාජය තුළ විවිධ ගැටළු, ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වි ඇති බව පර්යේෂණාත්මකව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාක්ෂණය සමඟ ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමඟ එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවියන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ. තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මාගේ සුභාෂිංසන

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධිකාරක,

සෙනෙවිරත්න මහලේකම්

ISBN 978-624-208-224-0